# ජාතික රණවිරු සැමරුම් උත්සවය අමතා ගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා විසින් කළ කතාව ( 2015.05.19 වන දින මාතරදී )

අද මේ රටේ මෑත යුගයේ අපට ලැබුණු ඓතිහාසික දිනයක් සමරන අවස්ථාවක්. විශේෂයෙන්ම වසර 30 කට ආසන්න ම්ලේච්ඡ ත්‍රස්තවාදය මේ රටින් අවසන් කරලා රටට සාමය ලබාදුන්න රටේ ඒකීයභාවය භෞමික අඛණ්ඩතාවය රැක ගනිමින් මාතෘ භූමියේ ජාතියේ උරුමය ආරක්ෂා කළ දිනය විදිහටයි අද දවස අපි සළකන්නේ.

එල්.ටී.ටී.ඊ ත්‍රස්තවාදීන්ගේ ම්ලේච්ඡ යුද්ධයේ අත්දැකීම් ඔබ අප සියලුදෙනාටම තිබෙනවා. ඒ ම්ලේච්ඡත්වය තුළ සැබෑ ලෙසම මනුෂ්‍යත්වය ගිලිහී ගොස් සත්‍ය යටපත් වී, සාමය විනාශ වී, ලේ වැගිරීම් තුළ ජීවිත දස දහස් ගණනින් අපිට අහිමි වුණා. කිසිවිටෙක යුද්ධයක් තුළ මානුෂිකත්වය ඇතිවන්නේ නැහැ. ඒ නිසා අපිට අපේ උතුම් මාතෘභූමියේ ආරක්ෂාව වෙනුවෙන් අපේ ශ්‍රේෂ්ඨ රණවිරුවන් යුද, නාවික, ගුවන්, පොලිස්, සිවිල් ආරක්ෂක මේ සියලු ආරක්ෂක අංශවල ආරක්ෂක සේනාංකවල ඒ සෑම කෙනෙක්ම ජීවිත පරිත්‍යාග කරමින් මේ සටන කරනු ලැබුවා.

80 දශකයේ මුල්භාගයේ ආරම්භ වූ යුද්ධය ඒ ගෙවී ගිය දශක කිහිපය තුළ ජාතියේ මහ ඛේදවාචකයක් බවට පත්වුණා. අපේ රටේ සංවර්ධනය ඇණ හිටියා. ජනතාවගේ බලාපොරොත්තු සුන් වුණා. එහෙත් ඒ සියල්ල තුළ අපේ රටේ ජනතාවත් ආරක්ෂක අංශවල සියලු දෙනාත් මා සඳහන් කළ පරිදි ජීවිත පරිත්‍යාගයෙන් මේ සටන ජයග්‍රහණය කිරීම වෙනුවෙන් කැප වුණා. ඒ කැපවීම කළ සියලුදෙනාට ජාතියේ ගෞරවය හිමිවෙනවා. යුද, නාවික, ගුවන්, පොලිස්, සිවිල් ආරක්ෂක ඒ සියලු දෙනාට වගේම යුද්ධය ආරම්භ වූ 80 දශකයේ සිට මේ යුද්ධය අවසන් කරන්නට උරදුන් කැපවුණු රාජ්‍ය නායකයින් සියලුදෙනාටත් අපි අපේ ජාතියේ ගෞරවය හිමි කරදිය යුතු වෙනවා. අපේ ශ්‍රේෂ්ට රණවිරුවන් ඒ කළ උදාර ජාතික මෙහෙවර අපිට මිල කරන්න බැහැ. ඒ නිසා ශ්‍රී ලංකා රජයේත් සමස්ත ලාංකීය ජනතාවගේත් මුළු මහත් ජාතියේත් ගෞරවය අපේ රණවිරුවන්ට නැවත වරක් අද දවසේ අපි පුද කරනු ලබනවා.

විශේෂයන්ම අපි අවධානය යොමු කළ යුතු වෙනවා යුද්ධය වසර 30 කට ආසන්න කාලයක් පැවතීමට හේතු වූ කරුණු මොනවාද කියන කාරණාව. වසර 30 කට ආසන්න කාලයක් පැවති යුද්ධය ආරම්භවීමට ඊට පෙර දශක කිහිපය තුළ ඇති වූ සිද්ධීන් සහ රජයන් කටයුතු කළ ආකාරය හේතු වූයේ කොයි ආකාරයට ද කියා අපි අධ්‍යයනය කළ යුතු වෙනවා. එදා දමිළ, මුස්ලිම්, සියලු ජාතීන් සහෝදරත්වයෙන් කටයුතු කළා. ඒ යුගය තුළ සැබෑ නායකයින් තමන්ගේ වගකීම සහ යුතුකම ජනතාව සමග ඉටු කරනු ලැබුවා.

1948 අපි ලබා ගත් ඒ නිදහස මේ රටේ සියලු ජාතීන්, සියලු ආගම් සියලුදෙනාගේ එකමුතුව තුළ තමයි ඒ ජාතික නිදහස් අරගලය එදා තිහ හතළිහ දශකවල ගෙන ගියේ. ඒ තුළ අපි ලැබූ නිදහස සමග අපි ඉන් පසුව ජාතීන් අතර රට තුළ සමගිය සහජීවනය සංහිඳියාව ඇති කර ගැනීමට ගත්තා වූ ක්‍රියාමාර්ගවල අඩුලුහුඩුකම් රාශියක් ඇති වුණා. ඒනිසා අපේ රටේ ජාතීන් අතර අසමගිය ගොඩනැගුණා. අවසාන ප්‍රතිඵලය වුණේ ම්ලේච්ඡ ත්‍රස්තවාදයකට අප සියලුදෙනාටම මුහුණ දීමට සිදු වීමයි.

2009 මැයි මාසේ 18, 19 දෙදින වල යුද්ධය අවසන්වීමෙන් පසුව එළැඹියේ සාමකාමී පරිසරයක්. ඒ පශ්චාත් යුද සමය තුළ අප විසින් ඉටු කළ යුතු කාරයයන් නිසි ලෙස ඉටු වුණාද කියන කාරණාව පිළිබඳව අපේ බුද්ධිය, ඥාණය, ප්‍රඥාව, දැනුම, අත්දැකීම් අනුව අප විමසා

2/4

බැලිය යුතු වෙනවා. මා හිත්තනේ ඒ කාර්යය අප වෙතින් ඉටු වුණේ නැහැ. භෞතික සම්පත් සංවර්ධනයට මුල් තැන දුන්නා. භෞතික සම්පත් සංවර්ධනය තුළ ජාතීන්ගේ සංහිඳියා පිළිවෙතක් සම්බන්ධයෙන් ප්‍රමුඛත්වයක් ලැබුණේ නැහැ.

විශේෂයෙන්ම බිඳුණු ගොඩනැගිලි, කැඩුණු පාරවල්, කැඩුණු විනාශ වුණු භෞතික සම්පත් යළි ගොඩනැගීම ඇති වුණත් බිඳුණු සිත් යළි ගොඩනගන්නට පශ්චාත් යුද සමය තුළ සංහිඳියා පිළිවෙතක් ක්‍රියාත්මක කිරීම සිදුවුණේ නැහැ. ඒ නිසා අපි නව රජය විදිහට පැහැදිලිව සඳහන් කරන්නට ඕනැ නව රජයේ ප්‍රතිපත්තිය වන්නේ සංවර්ධනය සහ සංහිඳියාවයි. සංවර්ධනය තුළ පමණක් සංහිඳියා පරමාර්ථ ඉටු කර ගැනීමට පුළුවන්වන්නේ නැහැ. සංහිඳියා පිළිවෙතක් පිළිබඳව කථා කරන විට සත්‍ය ගවේෂණය, යුක්තිය ඉටු කිරීම, සියලු ජාතීන් අතර බිය සැක අවිශ්වාසය නැති කිරීම, සියලු ජාතීන් අතර විශ්වාසය ඇති කර ගැනීම, යුද්ධයෙන් විනාශ වූ භෞතික දේ නැවත ගොඩනැගීම කියන කරුණු ඉටු කිරීම අවශ්‍ය වෙනවා. ඒ නිසා අපිට ඒ යුද්ධයේ අත්දැකීම් සමග විශේෂයෙන්ම සංහිඳියා පිළිවෙතක තිබෙන්නාවූ ප්‍රමුඛතාවය පැහැදිලිව තේරුම් ගැනීම ඉතාමත් අත්‍යවශ්‍ය වෙනවා.

යුද්ධය ආරම්භ වූයේ ගොවි ජනතාවගේ ජලය පිළිබඳව ඇති වූ ප්‍රශ්නයක් සමගයි. ඒ මුල් වකවානුවේ සිට ගෙන ගිය සටන්වල අවසාන සටන මාවිල්ආරු ජලය මුල් කරගෙන ඇතිවූ සිද්ධියෙන් ඒ තුළ ගොඩනැගුණු තත්ත්වයන් එක්ක අපිට සාමය ලගා කිරීමේ අවසන් යුද්ධය ආරම්භ කිරීමේ අවස්ථාව ලැබුණා. මාවිල්ආරු ජලය මත ඇතිවුණු යුද්ධය අවසන් වුණේ නන්දිකඩාල් ජලය මතින් කියලයි මා විශ්වාස කරන්නේ.

ඒ නිසා අපි මේ සියලුදේ පිළිබඳව අවධානය යොමු කිරීමේදී අද දවසේත් හෙට දවසේත් අපේ වගකීම් සහ යුතුකම් නිසි ලෙස ශ්‍රී ලාංකික ජනතාව වෙනුවෙන් ඉටු කළ යුතුවෙනවා. ත්‍රිවිධ හමුදාව, පොලිසිය, සිවිල් ආරක්ෂක බලකාය යුද්ධයේදී කරනු ලැබූ ඒ කැපවීම රජයේ ප්‍රතිපත්ති තුළ ජාතික සංහිඳියා පිළිවෙත ක්‍රියාත්මක කිරීමේදීත් කරනු ලබන බව මා දන්නවා.

විශේෂයෙන්ම ජනතාව තුළ බිය සැක අවිශ්වාසය නැති කරමින් සියුලදෙනා තුළ අන්‍යෝන්‍ය අවබෝධය ඇති කරමින් සෑමකෙනෙකුගේම වගකම් සහ යුතුකම් මෙනෙහි කරමින් අපේ කටයුතු අපි කාර්යක්ෂමව සහ විධිමත්ව ඉටු කළයුතු වෙනවා. රට තුළ අපිට තිබෙන්නාවූ අභියෝග ජය ගැනීමට අද දවසේ වගේම හෙට දවසේ අපේ කාර්යයන් ඉටු කිරීමේදී ඉතා පැහිදිළිවම මා සඳහන් කළේ සංවර්ධනය සහ සංහිඳියාව කියන සටන් පාඨය අපි එකම ආකාරයකට ක්‍රියාත්මක කිරීම ඉතාම අත්‍යවශ්‍යවන්නා වූ කාරණයක් ලෙසයි. ඒනිසා ඔබට මුළු මහත් ජාතියේම ගෞරවය පුද කරනවා වගේම ඔබට ඒ පිළිබඳව ලැබෙන ගෞරවය ජාතියේ ශක්තිය බවට පත් කරමින් ඔබේ ඉදිරි කටයුතු වලදී විශේෂයෙන්ම අපි නව රජය විදිහට පැහැදිලිව සඳහන් කරනවා ජාතික ආරක්ෂාව ශක්තිමත් කරමින් අපේ මාතෘභූමියේ අනාගතය සඳහා නව රජය විදිහට ගත යුතු සෑම ක්‍රියාමාර්ගයක්ම ගන්නා බව.

ආරක්ෂක මණ්ඩලීය රැස්වීම්වලදී ආරක්ෂක ප්‍රධානීන් වෙත අප විසින් දෙනු ලබන උපෙදස් අනුව නව ජාතික ආරක්ෂක පිළිවෙතක් නව ජාතික ආරක්ෂක සැළැස්මක් පිළිබඳව මේ වනවිටත් අවශ්‍ය කටයුතු සිදුවෙමින් පවතිනවා. නැවත මේ රටේ යුද්ධයක් ඇති නොවීමේ වගකීම අපි පැහැදිලිවම භාරගන්නවා.

ම්ලේච්ඡ ත්‍රස්තවාදයට නැවත මේ රටේ හිස එසවීමට අපි කිසිසේත්ම ඉඩ තබන්නේ නැහැ. සංවර්ධනය සහ සංහිඳියා පිළිවෙත ශක්තිමත් කරනවා වගේම ත්‍රිවිධ හමුදාව ප්‍රමුඛ ආරක්ෂක අංශ පිළිබඳව දැඩි විශ්වාසයක් සහ ගෞරවයක් අපි තබා තිබෙනවා.

3/4

විශේෂයෙන්ම ජාතික ආරක්ෂාව සම්බන්ධයෙන් කටයුතු කිරීමේදි ඒ සඳහා දිය යුතු සියලු භෞතික සම්පත් සහ මානව සම්පත් නොඅඩුව ලබාදෙමින් විශේෂයන්ම හමුදා සේවාවන් වල අවශ්‍ය ශක්තිය වැඩිදියුණු කරමින් ඔබට ඒ සඳහා ක්‍රියා කිරීමට අවශ්‍ය පරිසරය ලබාදීම සඳහා ගත හැකි සෑම පියවරක්ම අපි ගන්නා බව ඉතාම පැහැදිළිව සඳහන් කරන්නට ඕනැ.

ඇතැම් අවස්ථාවල දේශපාලන ප්‍රතිවාදීන්ගෙන් වර්තමාන රජය කෙරෙහි බලන්නා වූ විවිධ කෝණයන් විවිධ පැතිකඩයන් ගත්විට අපිට පෙනී යනවා ඇතැම් අංශවල අන්තවාදී අදහස් දරණ පිරිස් සිටිනවා. ජාතීන් අතර අසමගිය ඇති කිරීම සඳහා අන්තවාදී පිරිස් අපේ රටෙත් ඉන්නවා ලෝකයේ වෙනත් රටවලත් ඉන්නවා. ජාත්‍යන්තරය තුළත් ඉන්නවා. මේ අන්තවාදීන් විසින් කරනු ලබන වැරදි ප්‍රචාරයන් සම්පූර්ණයෙන්ම ප්‍රතික්ෂේප කරමින් රාජ්‍ය ප්‍රතිපත්ති තුළ අපි කටයුතු කිරීමේදී ඉතා පැහැදිළිවම ජාතික ආරක්ෂාව ශක්තිමත් කරමින් ත්‍රිවිධ හමුදාව ශක්තිමත් කරමින් ඔබේ වගකීම සහ යුතුකම් ඉටු කිරීමට සියලු සම්පත් ලබාදෙමින් ඔබ කෙරෙහි දැඩි විශ්වාසයකිනුයි අපි කටයුතු කරන්නේ.

ඒ නිසා රණවිරු සැමරුම් දිනයේදී ජාතියේ සාමය ඇතිවූ දිනය විදිහට ජාතීන් අතර සංහිඳියා පිළිවෙතට මුල්තැන දීමේ දිනය විදිහට සළකමින් ඉදිරි අනාගතය තුළ කටයුතු කිරීමේදී අපේ වගකීම් සියල්ල ඉටු කිරීමේදී අපි සෑම කෙනෙකුගේ ඒ පුළුල් වගකීම සහ යුතුකම් නිසි ලෙස ඉටුවනු ඇතැයි මා විශ්වාස කරනවා.

අපේ ආදරණීය ජනතාව 30 වසරක යුද්ධයේදී කරන ලද කැපවීම් මේ රටේ සංවර්ධනය තුළ රටේ ජනතාවට රටට ලබාදිය යුතු සියලු ' වරප්‍රසාද සහ පහසුකම් සමාජ සුබසාධනය අප නොපිරිහෙලා කිසිදු අඩුපාඩුවකින් තොරව ඉටු කරන බව සඳහන් කරන්න ඕන.

අද දවසේ මේ උතුම් දිනය අපි සයලු දෙනාම සලකන්නේ ජාතියේ සාමය ඇති වූ දිනය ලෙසයි. රටේ සාමය ඇති වූ දිනය ලෙසයි. ඔබ සියුලදෙනාට ගෞරව කරන දිනය ලෙසයි ඒ වගේම රටේ සංවර්ධනයේ සහ සංහිඳියාවේ නව පිටුවක් පෙරළෙන දිනය ලෙසයි. මා මීට පෙර ප්‍රකාශ කළ ආකාරටයම සංවර්ධනය සහ සංහිඳියාව මූලික තේමාව කොට ගනිමින් ඔබ අප සියලුදෙනාම එක්වෙමු. අද ජීවත්වන ජනතාවට වගේම හෙට උපදින දරුවන් සඳහා අපේ මාතෘභූමිය වෙනුවෙන් අපේ ජාතියේ යහපත වෙනුවෙන් ශ්‍රී ලාංකික ජනතාව වෙනුවෙන් රටේ ඒකීයභාවය භෞමික අඛණ්ඩතාවය සඳහා අප සියලු දෙනාම කළ යුතු වගකීම් නිසිලෙස ඉටු කරමු.

අපේ රජය කෙරෙහි ඔබ සෑම කෙනෙක්ම තබා ඇත්තේ දැඩි විශ්වාසයක් සහ ගෞරවයක්. ඒ නිසා අද දවස අපි මේ රටේ ප්‍රධාන වශයෙන්ම නව පිටුවක් පෙරළමින් සාමයේ දේශයක් ලෙස රට ඉදිරියට ගෙනයාමට අධිෂ්ඨානශීලීව කටයුතු කරමු.

ඔබ සියලු දෙනාට තෙරුවන් සරණයි.